# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 238/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 09/02/2024 පැය 1950

**මාධ්‍ය නිවේදනය**

**ව්‍යාජ වාහන අංක තහඩු හා ව්‍යාජ ලේඛණ සකස් කරනු ලැබූ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකාය.**

පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් විසින් 2024.02.08 වන දින මුල්ලේරියාව පොලිස් වසමේ හිඹුටාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර නීත්‍යානුකූල බලපත්‍රයක් හෝ ලියවිල්ලක් හා අංක තහඩු නොමැතිව වාහනයක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුල්ලේරියාව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 56 ක් වන මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු, 2024.01.22 වන දින බෙලිඅත්ත පොලිස් වසමේදී පුද්ගලයින් 05 දෙනෙකු වෙඩි තබා ඝාතනය කිරීමේ සිද්ධියට වෙඩි තැබීමට පැමිණි ජීප් රථයේ රියදුරු වශයෙන් කටයුතු කල බවට සැක කරන, දැනට පලා ගොස් සැඟව සිටින, සැකකරු සමඟ සමීප සම්බන්ධතා පවත්වා ඇති බවත්, මීට මාස කිහිපයකට පෙර ඉහත පලා ගොස් සැඟව සිටින සැකකරුට මොහු විසින් යතුරු පැදි දෙකකට ව්‍යාජ බලපත්‍ර මුදලට සාදා දී ඇති බවත්, දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වී ඇත.

ඒ අනුව සැකකරුගේ නිවස පරීක්ෂා කිරීමේදී, නීත්‍යානුකූල බලපත්‍රයක් හෝ ලියකියවිල්ලක් හෝ අංක තහඩු නොමැති ත්‍රී රෝද රථයක් හා ජංගම දුරකථනයක් විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත.

තවද, පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඉහත වෙඩි තබා ඝාතන සිද්ධියේ ජීප් රථයේ රියදුරු ලෙස කටයුතු කළ බවට සැකකරන දැනට පලා ගොස් සැඟව සිටින සැකකරු සමඟ දුරකථන මඟින් සම්බන්ධතා පවත්වන ලද සැකකරුවෙකු 2024.02.08 වන දින මරදාන පොලිස් වසමේ දී අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් එම සැකකරු වයස අවුරුදු 57 ක් වන නාරාහේන්පිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රශ්ණ කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත මෙම සැකකරුගේ නිවස පරීක්ෂා කර ව්‍යාජ ලෙස සකසන ලද වාහන ආදායම් බලපත්‍ර හා ලියකියවිලි, රබර් මුද්‍රා 03 ක් හා ජංගම දුරකථන 02 ක් විමර්ශන නිලධාරීන් භාරයට ගෙන ඇත. මෙම සැකකරු විසින් ඉහත සාතනයට යොදා ගත් ජීප් රථයට අංක තහඩු හා ලේඛණ ව්‍යාජ ලෙස සකස් කර දී ඇති බවට සැකකරනු ලබයි.

ඉහත සැකකරුවන් දෙදෙනා සම්බන්ධයෙන් මුල්ලේරියාව හා මරදාන පොලිස් ස්ථාන මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**